# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,812—1941ක්වූ නොවැම්බර් මස 14 වෙනි දිනවූ සිකුරාද.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාධිශ නීති.

L D—B 269/31

**වන්දනා ගමන් පිළිබඳ ආඥාපණතයි.**

**කතරගම ඉල්මහ කාච්චි මඩුගල්‍යය සම්බන්ධ නියෝග.**

වන්දනා ගමන් පිළිබඳ ආඥාපණතේ (133වෙනි පරිච්ඡේදය) 2 වන වගන්තියෙන් බලයලත් ප්‍රකාර 1941කේ දෙසැම්බර් මස පවත්වණුලබන ඉල්මහ කාච්චි මඩුගල්‍යය සම්බන්ධ සිරිත් පරිදි කතරගමට කෙරෙන වන්දනාගමණ අරමුණුකොට මෙහි පහත දක්වෙන නියෝග මෙම දන්වීම මගින් ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ වන ඇන්ඩ්‍රු කොල්ඩිකට් නමැති ඔව්සින් පණවනලදී.

ඒ. කොල්ඩිකට්,
ලංකාණ්ඩුකාර-උතුමාණන්වහන්සේ.

1941ක්වූ නොවැම්බර් මස 5වෙනි දින
කොළඹදීය.

---

**නියෝග.**

1. මේ නියෝග සඳහා "වාඩිය" යයි සලකනුලබන්නේ:—

(අ) කතරගම මහදේවාලයේ සිට සැමදෙසින්ම හැතැප්ම භාගයක් ඇතුළත ප්‍රදේශය ; හා

(ආ) සෙල්ල කතරගම පිහිටි පිල්ලයාර් කෝවිලේ සිට හැතැප්ම කාලක් ඇතුළත ප්‍රදේශයද වේ.

2. (අ) කතරගම ඉල්මහ කාච්චි මඩුගල්‍යය හා කතරගම වන්දනාකාරයින්ගේ නැවතීම පිළිබඳ කාලය වන 1941කේ දෙසැම්බර් මස 2 වන දින පටන් එම මස 4 වන දින අවසානය දක්වා දවස් 3ක් සීමාකළයුතු බැවින් එය මෙසින් මෙසේ සීමාකරණු ලැබේ.

(ආ) කිසිම වන්දනාකරුවෙක් දෙසැම්බර් මස 2වෙනි දිනට පෙර වාඩියට පැමිණීමද, එම මස 4වෙනි දිනට පසු වාඩියේ නැවතීමද නොකළ යුතුයි.

3. මෙම වාඩියේ කටයුතු ඌවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ සාමාන්‍ය පරිපාලනය පිට හා වෛද්‍ය මූලාදෑනි කෙනෙකුගේ සහ පොලිස් මූලාදෑනියෙකුගේත් ආධාරලත් "ස්ථාන පාලක නිලධාරීතැන" යයි නම්කරණලද මූලාදෑනි කෙනෙකුගේ තීක්ෂණ පරිපාලනය පිටද පවතී.

4. (1) ස්ථානපාලක නිලධාරීතැනට කතරගමදීද කතරගමට යන එන අතරමගදීද, පහත දක්වෙන නියෝග සැලැස්වීමට බලය තිබේ :—

(අ) සේදීමට හා නෑමටද, වතුර ඇදගන්න බීමටද, ශරීර කෘත්‍යයන් සඳහාද වන්දනාකාරයින්ගේ විශේෂ ප්‍රයෝජනයට විශේෂ ස්ථාන නියමකිරීමටද ;

(ආ) එක් එක් වර්ගයේ වන්දනාකාරයින්ට නැවතීමට ස්ථාන නියමකිරීමටද ;

(ඉ) යම්කිසි වන්දනාකාර කාණ්ඩයක් විසින් යායුතු මාර්ග නියම කිරීමටද ;

(ඊ) වන්දනාකාරයින්ට දෙන සියලුම ආහාර බෙදාදීම හසුරුවීමටද ;

(උ) අසනීපවන වන්දනාකාරයින්ගේ ප්‍රයෝජනය පිණිස වාසස්ථාන වෙන්කොට නියමකිරීමටද ඔවුන් සමග ගණුදෙනු කරාබස් තහනම්කිරීමට හා ඔවුන්ට යැමට නුසුදුසුවන්නම් නවත්වාගැනීමටද බලය තිබේ.

(2) ස්ථාන පාලක නිලධාරීතැන විසින් මෙහි ඉහත 1වෙනි වගන්තියට සඳහන් කටයුතු සම්බන්ධව නීතිප්‍රකාර දෙනු ලබන කිසිම නියෝගයකට කිසිවෙක් අකීකරු නොවිය යුතුයි.

5. ආණ්ඩුවේ ඒජන්තතුමන් විසින් හෝ එතුමන්ගේ අනුමතය පිට හෝ ශරීර කෘත්‍යයන් සඳහා විශේෂයෙන් සලස්වා තිබෙන ස්ථානයක හැර වාඩියේ අන්‍ය ස්ථානයක කිසිවෙකු විසින් මලමූත්‍ර පහකිරීම නොකළ යුතුයි.

6. ආණ්ඩුවේ ඒජන්තතුමන් විසින් හෝ එතුමන්ගේ අනුමතය පිට හෝ කුණු කසල දැමීමට සලස්වා තිබෙන භාජනවල හෝ ඒ වෙනුවෙන් වෙන්කර තිබෙන ස්ථානයක හැර වාඩියේ අන්‍ය කිසිම ස්ථානයක කුණු කසල ආදිය නොදැමිය යුතුයි.

7. ස්ථානපාලක නිලධාරීතැන විසින් ගඟේ නෑමට නියම කරණලද ස්ථානයෙහි හැර ඊට ඉහළින් වාඩියට අයිති සීමාවතුළ කිසිවෙකු විසින් ගඟට බැසීම හෝ නෑම හෝ නොකළ යුතුයි.

8. ස්ථානපාලක නිලධාරීතැනගෙන් අවසරපත්‍රයක් නොලබා නැත්නම් එබඳු අවසරපත්‍ර දීමට එකී නිලධාරීතැනගෙන් බලයලත් යමෙකුගෙන් අවසරපත්‍රයක් නොමැතිව වාඩියේ සිට හැතැප්ම කාලකින් ඇතුළට ගවයෙක් හෝ කරත්ත ගොනෙක් ගෙනඒම නොකළ යුතුයි.

9. ඉහත සඳහන් පරිදි අවසරපත්‍ර දෙනුලබන්නේ වාඩියතුල රථවාහන ගමනාදිය සම්බන්ධවද වාඩියේ සනීපය ආරක්ෂාකර ගැණීම සම්බන්ධවද ස්ථානපාලක නිලධාරීතැන විසින් පනවනලද නියෝගයන් අවසරපත්‍රලත් අය විසින් ඉෂ්ටකරන පොරොන්දුව පිටය.

10. ඌව දිසාවේ ඒජන්තතුමාගෙන් පළමුවෙන් ලබාගන්නාලද අවසරපත්‍රයක් නොමැතිව කිසිවෙකු විසින් වාඩිය තුළ පාන්ගෙයක් හෝ සිසිල්බීම පෙරණ යන්ත්‍රයක් හෝ තේ හෝ කෝපි කඩයක් හෝ භෝජන ශාලාවක් හෝ සාලක් නොතැබිය යුතුයි. එවැනි අවසරපත්‍ර නොමිලේ දෙනුලැබේ.

11. (1) වෙළඳාම පිණිස බඩු තැබීම සඳහා සනීපාරක්ෂක නිලධාරීතැන විසින් වෙන්කර තිබෙන තැනෙක හැර වාඩියේ වෙන කිසිම ස්ථානයක මොනයම් වෙළඳ ද්‍රව්‍යයක් නමුත් වෙළඳාම පිණිස නොතැබිය යුතුයි.

(2) තවද සනීපාරක්ෂක නිලධාරීතැන විසින් හෝ වෛද්‍ය මූලාදෘනිතැන විසින් හෝ ඔවුන් නැතිතැන පොලිසියේ ප්‍රධාන නිලධාරීතැන විසින් ආහාරයට නුසුදුසුයයි නියමකරනුලබන යම් කෑමවර්ගයක් කිසිවෙකු විසින් නොවිකිණිය යුතුයි.

(3) සනීපාරක්ෂක නිලධාරීතැන විසින් හෝ වෛද්‍ය නිලධාරීතැන විසින් හෝ එබන්දෙක් නැත්නම් පොලිසියේ ප්‍රධාන නිලධාරීතැන විසින් ආහාරයට නුසුදුසුයයි ප්‍රකාශකරනලද සියලුම ආහාර ද්‍රව්‍ය තහනම්වගෙන විනාශකරදමන්ට පොලිසියේ මූලාදෘනී කෙනෙකුට හෝ සැනිටරි ඉන්ස්පැක්ටර් කෙනෙකුට නීත්‍යනුකූලව බලය තිබේ.

12. (1) භෝජන ශාලාවල්ද, කෝපි සහ තේවතුර කඩද පිරිසිදුව සනීපය ආරක්ෂාවන පරිදි තබාගත යුතුයි.

(2) විකිණීමට තබනලද සියලුම කැවිලි හා රසකෑම ජාතිද උයනලද කෑම ද්‍රව්‍යයන්ද නිසිආකාර සාදනලද මැස්සන්ට යෑමට නුපුළුවන් වීදුරු පෙට්ටිවල බහා තැබිය යුතුයි.

(3) පානීයපිණිසකොට ඉතිරිවන තේ, කෝපි, කිරි හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය කිම එසේ මෙසේ නොදමා ඒවා සුදුසු මෙහි පහත විස්තරකරණුලබන අන්දමේ භාජනවල එකතුකොට සනීපාරක්ෂාව සඳහා පත්කරණුලැබූ අයවලුන් පැමිණ ගෙනයන තෙක් සෑම වේලාවල්හිම බහා තැබිය යුතුයි.

(4) වෙළඳහෙළඳාම පිණිස සාදනලද කොබනැවිලි, බැහි, කොට්ටු ආදී සෑම ස්ථානයකම කුණු රොඩු කැන්පත්කර තැබීම සඳහා ලෝහයෙන් හෝ ලීවලින් සාදනලද ඝණ අඟල් 4½කට අඩුනොවන ප්‍රමාණයක භාජනයක් සපයා තබා එම ස්ථානයෙහි රැස්වන කුණු කසල සියල්ලම එම භාජනය තුළ කැන්පත්කර තැබිය යුතුයි. කුණු කසල එහි කැන්පත්කරණ හෝ ඉන් ඉවත්කරණ කාලයන්හි හැර අන්‍ය සෑම වේලාවල්හිම එය ලෝහ හෝ ලී මූඩියකින් වසා තැබිය යුතුයි.

13. බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන කෙනෙක් කිසිවෙකු විසින් වාඩිය තුළට නොගෙනා යුතුයි. තවද එවැනි රෝගයකින් පෙලෙන කෙනෙකුට වාඩිය තුළට ඒමට කිසිවෙක් අනුබලදීමද නොකළ යුතුයි.

14. උත්සවය පවතිනාතර කතරගම මිසංගත රෝගයක් ඇතිවුවහොත් "උත්සවය අවසාන වූයේය" යි ප්‍රකාශකිරීමටද ඒ ගම හැර තමතමන්ගේ ගම්වලට වන්දනාකාරයින්ට පිටත්ව යෑමට අණකිරීමටද, ඔවුන් යායුතු මාර්ග නියමකිරීමටද ආණ්ඩුවේ ඒජන්තතුමාට නීතිප්‍රකාර බලය තිබේ.

15. වාඩියතුළදී යම්කිසිවෙකුට බෝවෙන හෝ පැතිරයන රෝගයක් වැළඳුනහොත් නැතිනම් එවැනි රෝගයකින් පෙලෙන්නේයයි දැන දැනම රෝගියෙක් සමග වාසයකරන්ට යෙදුනොත් ඒ බව වාඩිය ආරක්ෂක වෛද්‍ය මූලාදෘනිතැනට ඔහු විසින් දැන්විය යුතුයි.

16. වාඩියතුළ වීදියන් හැටියට පාවිච්චිකරණුලබන්නාවූ හෝ එසේ පාවිච්චිකිරීම පිණිස වෙන්කරණු ලැබුවාවූ ඉඩමක් අයුතුවන පරිදි ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් පළමුවෙන් අවසරයක් නොලබා කිසිවෙකු විසින් කිසිම ගොඩනැගිල්ලක් සෑදීම හෝ තිබෙන ගොඩනැගිල්ලක් විශාලකිරීම හෝ නොකළ යුතුයි.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

### කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි ආණ්ඩුව සන්තක ඉඩමක මිනිරන් හෑරීමේ බලය බදුදීමේ දැන්වීමයි.

වම් 1941ක්වූ දෙසැම්බර් මස 6වෙනි දින පෙරවරු 10ට කළුතර කච්චේරියේදී මෙහි පහත සඳහන් උප ලේඛනයේ විස්තර කරණ ආණ්ඩුව සන්තක ඉඩමේ මිනිරන් හෑරීමේ බලය කළුතර ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් ආණ්ඩුව සන්තක ඉඩම්වල මිනිරන් හෑරීමේ විධිවිධාන අනුව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. බදුදීම පළමුවෙනි වාරයම් අවුරුදු 5ට වේ. තවත් අවුරුදු 5ට බද්ද අලුත්කිරීමට බදුගන්නා අයට මුලු බලය තිබේ.

3. බදුදීමේ කොන්දේසි කළුතර ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන්ද, ඉඩම් කච්චේරියේ සිතියම් සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1941ක්වූ නොවැම්බර් මස 6වෙනි දින කොළඹ
ඉඩම් කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා වෙනුවට.

### උප ලේඛනය.

| ඉඩමේ විස්තරය සහ බිම් ප්‍රමාණය. | පිහිටීම. | ප්‍රමියම් මුදල. රු. ශ. | | බදුමුදල නොහොත් රෝයල්ටි මුදල. |
|---|---|---|---|---|
| ගලහිටියෙමුකලාන නමැති නො. 132 දරන අවසාන සිතියමේ නො. 413 දරන අක්කර 1, රූඩ් 3, පර්චස් 28 බිම්තරම ඇති කට්ටිය | නෑගෙනහිර පස්දුන් කෝරළේ උතුරු මහපත්තුවේ පැලෑද නමැති ගමේ | 500 | 0 .. | පළමුවෙනි අවුරුද්දේ සිට පස්වෙනි අවුරුද්ද දක්වා බදු මුදල වෙනුවට ඉඩමේ පතල්වලින් ලැබෙන සියලුම මිනිරන්වලින් සියේට පහෙන් පංගුවක වටිනාකම හෝ මුදලින් රුපියල් 200ක් යන ගණු දෙකෙන් වැඩි ගනන රෝයල්ටි මුදල වශයෙන් ගෙවිය යුතුයි. පතල්වැඩ නොකරණ කාලය ඇතුලත අවුරුද්දකට රුපියල් 200ක් බදු මුදල ගෙවිය යුතුයි |

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දළුගම විදුලිඑලිය බෙදන ස්ථානයක් සෑදීමට මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන විධානවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,357. ගම—දළුගන්ගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්ගේ නා. | මනස, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | පිංබත්ත .. | විදුලිඑලිය බෙදන ස්ථානයක් ඇති හිස්ඉඩම .. | ඇම්. ධම්මරක්ඛිත ථෙර, රජමහ විහාරය, කැලණිය | 0 | 0 | 1·95 |

එබැවින් ඉඩම් ලබාගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1941ක්වූ දෙසැම්බර් මස 18වෙනි දින පෙරවරු 10ට මහර කානායමේදී මං ඉදිරිපිටම පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා ඒවා සිව්ක්ව ඔහු සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒම ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා ඊට ඔහු මට මෙයින් දැනගත යුතුයි.

වම් 1941ක්වූ නොවැම්බර් මස 12වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඈල්. ජයසුන්දර,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වෙනුව.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ගෝනවල මිණීපිටිය විශාලකිරීමට මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන විධානවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,358. ගම—ගෝනවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්ගේ නා. | මනස, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | මිල්ලගහලන්ද .. | අවුරුදු 5–10 වයස පොල්ගස් 24ක්ද, කාණුවක කොටසක්ද ඇති පොල්ඉඩම | ඩබ්ලිව්. ඇස්. පෙරේරා, ගෝනවල, කැලණිය | 0 | 2 | 0·1 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1941ක්වූ දෙසැම්බර් මස 18වෙනි දින පෙරවරු 10.30ට මහර තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මේ ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒම ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුසි.

මේ 1941ක්වූ නොවැම්බර් මස 12වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඇල්. ජයසුන්දර,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වරයා.

---

203වෙනි පරිච්ඡේදය—ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රය යටතේ ආණ්ඩුවේ කටයුත්තකට ඒනම්:—උග්ගොඩ ලිදක් හෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ (203වෙනි පරිච්ඡේදය)" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 824. ගම—උඩුමෙ නැගෙනහිර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කම්ගෙයිවත්ත .. | අවුරුදු 7ක් වයසැති පුවක්ගහක් සහ අවුරුදු 10ක් වයසැති ගොරකගහක්ද ඇති වත්ත | උඩුමේ නැගෙනහිර දෙන් කරෝලිස් ගොන්සාදර | 0 0 0·7 |
| 2 | එම .. | අවුරුදු 7ක් වයසැති අඹගසක් සහ පුවක්ගස් 2ක්ද, අවුරුද්දක් වයසැති පුවක්පැලයක්ද ඇති වත්ත | එම .. .. | 0 0 2·2 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1941ක්වූ දෙසැම්බර් මස 8වෙනි දින පෙරවරු 10ගේ තානිසමට මාතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මේ ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුසි.

මේ 1941ක්වූ නොවැම්බර් මස 8වෙනි දින
මාතර කච්චේරියේදීය.

ඒ. ඇස්. ගොනොමිස් විකුම,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වරයා

---

## දැන්වීමයි.

**රත්නපුර දිස්ත්‍රික්කයේ ගලගම (බෙලිහුල්ඔය) අරක්කු සහ රා තැබෑරුම් විවෘතකිරීම ගැන ඒ පළාත්වාසීන්ගේ අදහස දැනගැනීම සඳහා ඡන්දය විමසීම.**

සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමාට ස්වදේශ කටයුතු භාර මිධායක සභාවේ නියමය පිට පහත සඳහන් දින සහ වේලාව තුළදී ගලගම රා සහ අරක්කු තැබෑරුම් විවෘතකිරීමට සියයට හැටක් (60%) විරුද්ධ යන්න දැනගැනීම පිණිස එකී තැබෑරුම් කොට්ඨාසය තුළ ඡන්දදායකයින්ගේ ඡන්දය විමසන බැව් මෙයින් දැනුම්දෙමි. තවද ඡන්ද විමසීමේ ප්‍රතිඵල ක්‍රියාවේ යෙදවීමට ස්වදේශ කටයුතු භාර මිධායක සභාව බැඳීනැති බැව් මෙයින් ප්‍රකාශකරමි.

| තැබෑරුමේ නම. | ඡන්දදීමේ වේලාව සහ දිනය. | ඡන්දයදෙන ස්ථානය. | කොට්ඨාශය. |
|---|---|---|---|
| (1) ගලගම අරක්කු තැබෑරුම, (2) ගලගම රා තැබෑරුම | 1941 දෙසැම්බර් මස 19වෙනි දින උදේ 8මේ සිට දවල් 12 වනතුරුත් සවස 1ගේ සිට 6 වනතුරුත් | ගලගම ගම්සභා උසාවියේදී | මුත්තෙට්ටුවෙගම ගම්මුලාදෑනියාගේ කොට්ඨාසයේ කරගස්තලාව, බිබිල සහ පම්බින්න, පහලගම ගම් මුලාදෑනියාගේ කොට්ඨාසයේ උඩබැද්දෙපිටවෙල, කුඹුරුයැනිවෙල, අස්සැද්දුන්වෙල, යක්දෙහිවෙල, වලකඩවෙල, මැද්දෙහිහිවෙල, ගෝනකුඹුරුවෙල ගල්අරුව සහ පහල ගලගම සහ ඩිංගල්ගම ගම් මුලාදෑනියාගේ කොට්ඨාසයේ සිංගල්ගම බින්නැනිගොල්ල, පුවක්ගස්අරුව, අගලගම, යටිඅගලගම සහ මුංවත්ත |

2. එමය සාමාන්‍ය පළාත් කැමැත්ත විමසීමක් නොව අදහස දැනගැනීමේ ඡන්දයක් බැව් විශේෂයෙන් සැලකිය යුතුසි. විවෘතකිරීමට විරුද්ධ අය ඡන්ද දීමට පැමිණිය යුතුසි.

1941 නොවැම්බර් මස 8වෙනි දින
රත්නපුර කච්චේරියේදීය.

ආර්. ඈම්. ගෙබ්වින්,
සබරගමු පළාතේ ඒජන්තතුමා.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.